

# ඒ මුවහතේ අයිතිය

මංජුල වෙඩිවර්ධන

සව්දිය නො පුරනා
සව්සිරි රැඳුණු දෙරණා
සව්සත සනහනා
සවුදියෙ සොඳුරු වරුණා

කැණිමඩල හෙල්ලී
පොල් අතු ඉගිල්ලී
මුකලන් සල්ලී
සොයා ඉගිළුණු මුතු කිරිල්ලී

මුත්තූර් මිණි මුතු
වුවා පමණි දැනමුතු
තෙමා ගත්තී නෙතු
පොහොණි කරනට මතු

ජීවිතේ පිරිපත
විදා අත්හළ හදවත
බලන් දෙව්දුනි කැටපත
කා අතද ඒ මුවහත

හැඟුම් හරි පරණ ය
කිරි බිඳු පවා උරණ ය
ඉදින් අසිපත සරණ ය
අත්වැරැද්දකි සොඳුරු මරණය






## පෙනේ නම් ඔබට මා දැන්

මලිති විජේසේකර

if you can see me now
පෙනේ නම් ඔබට මා දැන්
ඔබ කැමතිම රතු ගවුම ඇඳ
ඇවිද යන හැටි තවමත්
මල් ඉහුනු තණ බිම මැද
පාවහන් රහිතව,
ඔබ අකමැතිම විදිහට

පෙනේ නම් ඔබට මා දැන්
අපට හුරු අතුරු මං වල
සක්මනට යනහැටි තවමත්
දොඩන්නට නාඳුනන කුක්කෙකුට
නවතමින් ඉඳහිට,
ඔබ අකමැතිම විදිහට

පෙනේ නම් ඔබට මා දැන්
දම්පාට වළා ගෙන
වැහි බීරමක් එනවිට
නොඉඳ උණුහුම් වී
අප උණුහුම් ව උන් උදුන ළග
තෙමෙන්නට යන හැටි
ඔබ අකමැතිම විදිහට




# මව් සමර

| | |
|---|---|
| දරුවන් හදන්නට දුක් කරදර | වින්ද |
| ගත කල රැය ගණන් තැන නොමැතිව | නින්ද |
| හෙලුවන් විටෙක කඳුලැල්, මුත් ඉකි | බින්ද |
| අම්මේ දිරිය මව ඔබ වෙයි මන | නන්ද |
| සෙනෙහස, ආදරය, දරු පෙම අපරි | මිත |
| කරුණා, දයා, යහගුණ, මෙත්, බොඳුණු | මත |
| ඔබ සතු වෛර, ක්‍රෝධ, තන්හා මිදුණු | සිත |
| පෑදුනි දරුවන්ට යහ මග දකින | නෙත |
| ජීවිත අරුත කිම උගනිමි ඔබ | ගාව |
| මිනිසත් කම දිරිමි කල කී දේ | පෑව |
| ළද ඒ දැනුම පෙර දැරි කරවයි | මාව |
| කළ පිණකිනුයි ඉපදුනෙ ඔබ හට | දාව |
| නිරතුරු මගේ ලොව, මගෙ දිවි එළිය | කළ |
| සදහට නිවුනි ඒ දිදුලු පහන් | සිල |
| දහ නව වසරක්ය මේ නෙක් ගෙවුනු | කල |
| අම්මා නොමැති කල දිවියෙන් කිමද | පල |
| අම්මා ජීවත්ව සිටි අවසාන | දින |
| ඇය ලග රින්න මදි උනිදෝ කරපු | පිණ |
| වැලපෙමි හැම විටම එය මතකයට | එන |
| දෙපතුල වැඳ වැටෙමි ඔබ රුව | මවාගෙන |
| පැතුවත් යලිත් ඔබ පුතුවී උප | දින්න |
| බැරිබව දනිමි, හැක දුක වාවා | ගන්න |
| කල පිං දහමි, ගත් සිල්, ඔබ දන් | දුන්න |
| ඇති හොඳටෝම එය සසරෙන් ගොඩ | වෙන්න |

සරත් වීරසේකර

ටොරොන්ටෝ - කැනඩා




| | | |
|---|---|---|
| වසර දෙදහස් හතර | - | විසිහයවැනි දෙසැම්බර |
| සිරිකලම සෝ බර | - | දුකට පත්විය පිරි ගන'ඳුර |
| නත්තල් දිනට පසුදින | - | උදයේ නවය පසුවින |
| ගත සිත කිලිපොලන | - | පුවත වැටුනා සැණින් මා කණ |
| මෙතෙක් මා දිවියට | - | නෑසු මෙවන කලකට |
| සාගරය දෙබෑකොට | - | සුනාමිය මරු ගිලගතී රට |
| ගේ දොර ගස් කොලන් | - | හරි හම්බ කල දේ දුකින් |
| තත්පර ගණනකින් | - | අහිමි වී ගියෙ මහා පවකින් |
| මා පිය දූ දරුන් | - | නෑදෑ සමග මිතුරන් |
| වාහනත් ගෙනිහින් | - | සුනාමිය නොදකින් නොයෙකින් |
| තිබුනට හක්කෙ බුදුරැස් | - | බොක්කේ නිතර දඩමස් |
| ඉපයූ දේ කම්බස් | - | වෙලා රැල්ලට ගසාගෙන ගොස් |
| මගේ බුදු හිමියනි | - | මේ තරමු රළු රැල්ලට |
| පින්වත් ඔබේ පිළිමය | - | ගල් රුවක් මෙන් නොසැලී වැජඹේ |
| පාපී වන්නෙ'පා | - | අඳමිටුවන්ට පිටුපා |
| දැහැමි ලෙස ඔබ පා | - | නබා යනු යන ගමන සෙතපා |
| දහමට යොමා සිත | - | වැඩ කළහොතින් නිතවත |
| ගෙවා නියමායුෂ | - | යන්න හැකි වේ දෙව්ලොවක් වෙත |

වයලට් වීරසිංහ

නරේවරන්

අරුම පුදුම
සම්භාවය නිර්මාණයක්
නුඹ ලෝකයට....
එත්,
පින්සලක්
හරියට අල්ලන්න දන්නේ නැති
සිත්තරෙක් ඇඳපු
සිතුවමක්
නුඹ මට ........

කාංචනා විජේසේන

## සෝ සුසුම් !!

| | |
|---|---|
| නීලවන් ගුවන් ගැබ සුදු වළා | ගොනුවෙලා |
| ශ්වේතවන් සඳ මඩල තරු රටා විසිරි | ලා |
| රන් පැහැති කෙත් යාය මද නලින් | මත්වෙලා |
| සොබාදම ඔබේ රුව සොයයි මා ළං | වෙලා |
| වළා පෙළ පෙලින් පෙල සේද කෙඳි | විසිරිලා |
| තරු රශ්මි තැනින් තැන රැස් දහර | පතුරලා |
| සඳවතිය ටිකින් ටික සිනා මුව | පෙන්නලා |
| හරිතවන් දිගිතිගේ මුව කමල | හැඩකලා |
| සිසිල්වන් දිය දහර පිනි බිඳිති | විසිරිලා |
| මද පවන සමග ඔන මුදු සුවඳ | මත්කලා |
| ඈත රැස් දනව්වේ ළමා කළ | සිහිකලා |
| නොදැනීම මගෙ නෙතට කඳුලු බිඳු | එක්කලා |

නන්දිකා මිරිහාන

පර්ත් නුවර